| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/05/MF/01/චක්‍රලේඛ | | 2022.02.11 |

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2022/02 ට පළමු එකතුව

සියලුම විධායක කමිටු/ පාලක මණ්ඩල සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමනාකරුවන්

<u>2022 පෙබරවාරි මාසයට අදාල මාසික සමෘද්ධි සහනාධාර මුදල් සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත ගොස් ලබාදීම</u>

මා විසින් 2022.02.10 දින නිකුත් කරන ලද සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2022/02 මඟින් ලබාදුන් උපදෙස් අනුව **හෝ** මෙම එකතුව මඟින් ලබාදෙන උපදෙස් මත එක් ක්‍රමවේදයක් භාවිතා කර මෙම වැඩසටහන සාර්ථකව දියත් කරන ලෙස කාරුණිකව දන්වමි.

02. ඒ අනුව පොදු 36 ආකෘතිය අනුව ගෙවීම් වවුචරයක් එක් එක් ග්‍රාම නිලධාරි වසම් සඳහා සකස් කළ යුතුය. එහිදි පොදු ගෙවීම් වවුචරයක මුදල්වල වටිනාකම රු. 500,000/- නොඉක්මවිය යුතුය.

03. ඉන් අනතුරුව මුදල් හර පත්‍රයක් භාවිතා කර පහත ගිණුම් සටහන තබා, එක් එක් වසම් භාර සමෘද්ධි සංවර්ධන නිළධාරීන් වෙත මෙම ගෙවීම් කටයුතු සඳහා අත්තිකාරම් මුදලක් ලබාදිය යුතුය.

| | |
|---|---|
| බැංකු කටයුතු සඳහා ලබාගත් අත්තිකාරම් ගිණුම (කේත අංක 3312) | - හර |
| මුදල් ගිණුම | - බැර |

අදාල නිලධාරියා වෙත මුදල් භාරදෙන විට, මුල් චක්‍රලේඛයේ උපදෙස් අනුව (ඇමුණුම 01 හි පරිදි සටහන් කර) මුදල් ලබාදිය යුතුය.

04. අදාල වසම්භාර සමෘද්ධි සංවර්ධන නිළධාරියා විසින් සකස් කල පොදු 36 ගෙවීම් වවුචරය මගින් එක් එක් ප්‍රතිලාභීන් වෙත මුදල් ලබා දී, භාරගත් බවට අත්සන ලබාගෙන ඉතිරි වන මුදල සමග නැවත කඩිනමින් සමෘද්ධි බැංකු කළමනාකරු වෙත භාරදිය යුතුය.

05. ඉන් අනතුරුව, බැංකු කාර්ය මණ්ඩලය විසින් පහත පරිදි ගිණුම් සටහන් තබා මුදල් අත්තකාරම් පියවිය යුතුය.

I. <u>ඉතිරි මුදල බැංකු ගත කිරීම</u>.

| | | |
|---|---|---|
| මුදල් ගිණුම | - | හර |
| බැංකු කටයුතු සඳහා ලබාගත් අත්තිකාරම් ගිණුම | - | බැර |

II. <u>ගෙවීම් වවුවරය පියවීම. (ගිණුම් හිමියන්ට ගෙවන ලද මුදල)</u>

සාමාජික තැන්පත් ගිණුම - හර
බැංකු කටයුතු සඳහා ලබාගත් අත්තිකාරම් ගිණුම - බැර

පරිගණක මෘදුකාංගය මගින් සහ manual ක්‍රමයට එක් එක් ගිණුම් හිමියාගේ පුද්ගලික සාමාජික තැන්පත් ගිණුමේ ඉතිරි කිරීම් මුදල් ආපසු ගැනීමක් ලෙස සටහන් කර, තැන්පතු මුදලින් අඩු කර පෙන්විය යුතුය. ක්ෂේත්‍රයේ දී මෙම සහනාධාර මුදල් ගෙවීම් කිරීම 2022.02.14 දින සහ 15 දින දෙක තුල පමණක් කල යුතු අතර, 15 වෙනි දින සවස සියළු ඉතිරි මුදල් නැවත බැංකු වෙත තැන්පත් කල යුතු වේ.

04. එක් එක් ග්‍රාම නිළධාරී වසමට අත්තිකාරම් මුදල් ලබාදෙන විට, පොදු 36 ගෙවීම් වවුවරයේ නම සඳහන් ප්‍රතිලාභීන්ගේ ( සාමාජික තැන්පත් ගිණුම් හිමියන්ගේ) ගිණුම් වලට තැන්පතු මුදල් තිබෙන බවත්, එම මුදල Hold කර තැබීමට බැංකු කළමනාකරු ඇතුළු කාර්ය මණ්ඩලය විසින් සිදු කල යුතුය.

05. මුදල් රක්ෂණ සීමාවන් මුල් චක්‍රලේඛ පරිදි තවදුරටත් වලංගු වන බව ද සඳහන් කරමි.

06. ක්ෂේත්‍රයේ දී මෙම සහනාධාර ගෙවීම් කිරීමේ දී සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන සභාපති ඇතුළු ප්‍රජා නායකයින්ගේ ද සහය ලබාගැනීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව සඳහන් කරමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
4. අධ්‍යක්ෂ (සමාජ සුභසාධන හා සමාජ ආරක්ෂණ) , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
5. අධ්‍යක්ෂ, ප්‍රජාමූල සංවිධාන, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
6. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
7. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
8. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.